"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**
**பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**
**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary } දුරකථන / தொலைபேசி / Telephone - 011-2092599; ෆැක්ස් / பெக்ஸ் / Fax - 011-2092601; ඊ-මේල් / ஈ-மெயில் / Email chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி / General Telephone } 011-2093000

| | | |
|---|---|---|
| මගේ අංකය. / எனது இல. / My No. } CSWP/FIN-BK/06/FI/09 | ඔබේ අංකය. / உமது இல. / Your No. } | දිනය. / திகதி. / Date. } 2018.11. 12 |

**මූල්‍ය චක්‍රලේඛ 11 /2018**

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
සියළුම අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප),
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්(බ.ප.),
සභා ලේකම්(බ.ප.),
සමූපකාර සේවක කොමිෂන් සභා ලේකම්(බ.ප.),
ප්‍රධාන ලේකම් කාර්යාලයේ සියළුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්(බ.ප.),
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානින් (බ.ප.),
ප්‍රාදේශීය ලේකම්වරුන්(බ.ප.),

**<u>2018 වර්ෂයේ ගිණුම් පියවීම</u>**

2018 මුදල් වර්ෂය තුළ වියදම් දැරීම සඳහා දී ඇති වොරන්ට් බලපත්‍රයේ අධිකාරී බලය 2018 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන හෙයින් වැඩ, සැපයීම් හා සේවාවන් සඳහා ගෙවීමට ඇති මුදල් එම අධිකාරී බලය ඉක්මවීමට පෙර ගෙවා නිම කිරීම අත්‍යාවශ්‍ය කරුණකි. පුද්ගලයන්, ආයතන, දෙපාර්තමේන්තු හා සංස්ථා මගින් ඉටු කරවා ගන්නා ලද වැඩ සැපයීම් හා සේවාවන්ට අදාළ බිල්පත් නියමිත පරිදි ගෙන්වා ගෙන මුදල් වර්ෂය අවසන් වීමට පෙර නිරවුල් කිරීම පිණිස එහි සේවාවන් ලබා ගත් හෝ ඇණවුම් කළ හෝ නිලධාරින් විසින් අවශ්‍ය පියවර ගත යුතුය.

02. ඔබගේ අධීක්ෂණය යටතේ ඇති අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/කාර්යාල/ආයතන වල 2018 දෙසැම්බර් මස ගිණුම් පියවීම පිළිබඳ කටයුතු කිරීමේදී ඇතිවන තදබදය අඩු කිරීම සඳහාත්, ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහාත් පහත සඳහන් ක්‍රියා මාර්ග අනුගමනය කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

03. (අ) **විසර්ජන ලෙජරය**

I. 2018 වර්ෂයේ නිම කර ඇති සැපයීම් සේවාවන් හා වැඩ සඳහා අදාළ සියළුම ගෙවීම් 2018 දෙසැම්බර් මස 31 දිනට පෙර ගෙවා අවසන් කළ යුතුව ඇති බැවින්, ඔබ මගින් පාලනය වන කාර්යාල වල හා ආයතන වල සියළුම වවුචර්, බිල්පත් ඉහත දිනට පෙර ගෙවා අවසන් කිරීමට පියවර ගැනීම.

II. වෙන් කර දී ඇති මුදල් ප්‍රතිපාදනයන්ගේ සීමාවන් නොඉක්මවන බවට සැහීමට පත්වීම.



| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதம செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මුදල / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / பிரதான உள்ளக கணக்காய்வாளர் / Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel: 011-2092606 Fax: 011-2092609 dcsadmin@cs.wpc.gov.lk | Tel: 011-2092631 Fax: 011-2092647 dcspt@cs.wpc.gov.lk | Tel: 011-2092640 Fax: 011-2092636 csfinance@wpc.gov.lk | Tel: 011-2092532 Fax: 011-2092533 dsplancs@wpc.gov.lk | Tel: 011-2092501 Fax: 011-2092505 dsengcs@wpc.gov.lk | Tel: 011-2092628 |